63094

OL/2016/61/S-I, II (NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය : ..............................

## භූගෝල විද්‍යාව I

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

● අංක **1** සිට **10** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** සංයුතිය අනුව පෘථිවි පද්ධතියේ උප පද්ධති ගණන ........................................ කි.
(දෙක / තුන / හතර)

**2.** පෘථිවි කබොල ප්‍රාවරණයෙන් වෙන් වන්නේ .................................... අසන්තතියෙනි.
(ගුටෙන්බර්ග් / මොහොරෝවිසික් / ලෙහ්මන්)

**3.** පෘථිවියේ ඇති සම්පත් අතුරෙන් ........................................ ජෛව සම්පත් ගණයට අයත් වේ.
(පස / ජලය / වනාන්තර)

**4.** ලෝකයේ වඩාත් උසින් ම පිහිටා ඇති සානුව ........................................ සානුවයි.
(පාමීර් / ටිබෙට් / මොංගෝලියානු)

**5.** ........................................ ගංගාව විලකින් ආරම්භ වේ.
(තේම්ස් / රයින් / නයිල්)

**6.** කබොක් මිශ්‍ර රතු පස (Laterite soil) හිතකර සාධකයක් ලෙස අවශ්‍ය වන්නේ ................................ වගාවට ය.
(පොල් / රබර් / තේ)

**7.** ඩොලමයිට් පාෂාණය ........................................ දිස්ත්‍රික්කයේ බහුල ව ව්‍යාප්ත වී ඇත.
(නුවරඑළිය / යාපනය / මාතලේ)

**8.** බලශක්තිය නිපදවීම සඳහා ශ්‍රී ලංකාවේ බහුලව ම භාවිත කරන ශක්ති මූලය ...................................... වේ.
(ජලය / පෙට්‍රෝලියම් / ජෛව ස්කන්ධ)

**9.** ................................................ ලෝකයේ ප්‍රධාන ජන සංකේන්ද්‍රණයක් ලෙස සැලකේ.
(නැගෙනහිර ආසියාව / මධ්‍යම ඕස්ට්‍රේලියාව / නැගෙනහිර යුරෝපය)

**10.** පරිහරණය කිරීමේ පහසුව සඳහා ශ්‍රී ලංකා සිතියම 1:50 000 පරිමාණයට අනුව කොටස් 92 කට බෙදා මුද්‍රණය කර ඇත. එවැනි එක් සිතියම් කොටසකට අයත් භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර ........................................ කි.
(1 000 / 10 000 / 50 000)

[දෙවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK
EXAMMOOD.LK

- අංක **11** සිට **15** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් '**නි**' යන්න වටා ද, වැරදි නම් '**වැ**' යන්න වටා ද රවුමක් අඳින්න.

**11.** රත්න-තංගල්ල-මිද්දෙනිය යා කෙරෙන පොල් වගා ප්‍රදේශය 'සුළු පොල් ත්‍රිකෝණය' ලෙස හැඳින්වේ. **නි / වැ**

**12.** උන්නතාංශය සමග උෂ්ණත්වය ක්‍රමයෙන් ඉහළ යාම පරිවර්තී ගෝලයෙහි විශේෂ ලක්ෂණයකි. **නි / වැ**

**13.** ශ්‍රී ලංකාවේ මුළු ශ්‍රම බලකායෙන් වැඩිම ප්‍රතිශතය කෘෂි අංශයේ රැකියාවල නිරත ව ඇත. **නි / වැ**

**14.** ලෝකයේ මුළු ජන සංඛ්‍යාවෙන් 76%ක් පමණ වාසය කරන්නේ ආසියා හා අප්‍රිකා මහද්වීප දෙකෙහි ය. **නි / වැ**

**15.** කළු මුහුද සම්පූර්ණයෙන් ගොඩබිමින් වට වූ මුහුදකි. **නි / වැ**

- අංක **16** සිට **20** තෙක් ප්‍රශ්නවල '**අ**' සහ '**ආ**' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැළපූ විට නිවැරදි පිළිතුරට හිමි **අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

**16.** පෘථිවි වායුගෝලයේ ප්‍රධාන ස්තර කිපයක් '**අ**' තීරුවේ දක්වා ඇත. වායුගෝලීය ස්තරවල ව්‍යාප්තියෙහි ඉහළ සීමාවේ උස '**ආ**' තීරුවේ දැක්වේ. '**අ**' තීරුවේ අනුපිළිවෙළට '**ආ**' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. පරිවර්තී ගෝලය | A - 50 km |
| 2. මෙසෝ ගෝලය | B - 20 km |
| 3. අපරිවර්තී ගෝලය | C - 120 km |
| | D - 80 km |

(1) A, C, B (2) B, D, A (3) C, D, A (4) D, B, C (.........)

**17.** ශ්‍රී ලංකාවේ විදුලිය නිපදවනු ලබන බල මූල කිපයක් '**අ**' තීරුවේ ද, ඒ හා සම්බන්ධ බලාගාර පිහිටි ස්ථාන කිපයක් '**ආ**' තීරුවේ ද දැක්වේ. '**අ**' තීරුවේ අනුපිළිවෙළට '**ආ**' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. සුළං බලය | A - පුත්තලම |
| 2. තාප බලය | B - කොත්මලේ |
| 3. සූර්ය බලය | C - බරුතකන්ද |
| | D - කෙරවලපිටිය |

(1) A, B, C (2) B, C, D (3) D, A, C (4) A, D, C (.........)

**18.** ලෝකයේ හට ගන්නා ස්වාභාවික ආපදා කිපයක් '**අ**' තීරුවේ දක්වා ඇත. නිරතුරුවම ස්වාභාවික ආපදාවල බලපෑමට ලක් වන ප්‍රදේශ කිපයක් '**ආ**' තීරුවේ දැක්වේ. '**අ**' තීරුවේ අනුපිළිවෙළට '**ආ**' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. නියඟ | A - ඉන්දුනීසියාව |
| 2. සුළි සුළං | B - මධ්‍ය අත්ලාන්තික් සාගර කලාපය |
| 3. ලැව්ගිනි | C - බෙංගාල බොක්ක |
| | D - මධ්‍යම අප්‍රිකානු සහෙල් කලාපය |

(1) A, B, C (2) D, B, C (3) D, A, B (4) D, C, A (.........)

**19.** ශ්‍රී ලංකාවේ සිදු කෙරෙන ආර්ථික කටයුතු කිපයක් '**අ**' තීරුවේ දැක්වේ. ආර්ථික කටයුතු ව්‍යාප්ත ප්‍රදේශ කිපයක් '**ආ**' තීරුවේ දැක්වේ. '**අ**' තීරුවේ අනුපිළිවෙළට අනුව '**ආ**' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. කිවුල්දිය ධීවර කටයුතු | A - අඹේවෙල |
| 2. සුළු අපනයන බෝග වගාව | B - මීගමුව |
| 3. කිරිපට්ටි පාලනය | C - මාතලේ |
| | D - මහනුවර |

(1) B, C, A (2) A, B, C (3) B, D, C (4) C, B, A (.........)

**20.** ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදනයට ප්‍රමුඛ රටවල් කිපයක් '**අ**' තීරුවේ දක්වා ඇත. යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන කිපයක් '**ආ**' තීරුවේ දැක්වේ. '**අ**' තීරුවේ අනුපිළිවෙළට '**ආ**' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. චීනය | A - කුස්නෙට්ස් ප්‍රදේශය |
| 2. එක්සත් රාජධානිය | B - මැන්චූරියා ප්‍රදේශය |
| 3. රුසියාව | C - බර්මිංහැම් ප්‍රදේශය |
| | D - ග්ලාස්ගෝ ප්‍රදේශය |

(1) A, D, B (2) B, C, D (3) D, A, C (4) B, C, A (.........)

[තුන්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK EXAMMOOD.LK

- අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**21.** පෘථිවි ශිලාගෝලය එකිනෙකට සාපේක්ෂව ඉතා සෙමින් චලනය වෙමින් පවතින ........................................ රාශියකින් නිර්මාණය වී ඇත.

**22.** දකුණු අක්ෂාංශ $23\frac{1}{2}^{\circ}$ ........................................ නිවර්තනය ලෙස හඳුන්වයි.

**23.** ශ්‍රී ලංකාවෙන් ලබා ගන්නා මිනිරන්, ධමනි මිනිරන් හා ........................................ මිනිරන් ලෙස වර්ග කෙරේ.


**24.** සිතියම් වර්ග කිරීමට අනුව එක් සුවිශේෂී කරුණක් දැක්වීම සඳහා පමණක් භාවිත කරන සිතියම් ........................................ සිතියම් නමින් හැඳින්වේ.

**25.** අන්තර්ජාතික සාගර නීතිය අනුව ශ්‍රී ලංකාවේ 'රාෂ්ට්‍රීය මුහුදු සීමාවට' අයත් වන්නේ වෙරළ සීමාවේ සිට නාවික සැතපුම් ........................................ ක් දක්වා කලාපයයි.


- අංක **26** සහ **27** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ලංකා සිතියම යොදා ගන්න.

**26.** ගල්ඔය සේනානායක සමුද්‍රය පිහිටා ඇති දිස්ත්‍රික්කය දැක්වෙන්නේ ................................ අක්ෂරයෙනි.

**27.** ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශ අතුරෙන් 'මැදරට තේ' වගා කරන දිස්ත්‍රික්කයක් දැක්වෙන්නේ ........................... අක්ෂරයෙනි.




- 2015 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආනයන මූලාශ්‍ර දැක්වෙන ප්‍රස්තාරයක් පහත දැක්වේ. එය හොඳින් අධ්‍යයනය කර අංක **28** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2015)

**28.** ප්‍රස්තාරයට අනුව වර්ෂ 2015 දී ශ්‍රී ලංකාවට වැඩිම භාණ්ඩ ප්‍රමාණයක් ආනයනය කරන ලද රට ........................................ යි.

**29.** 2015 වසරේ ශ්‍රී ලංකාවට අඩුම භාණ්ඩ ප්‍රමාණයක් ආනයනය කරන ලද රට ........................................ යි.

**30.** 2015 ශ්‍රී ලංකාවේ ආනයන මූලාශ්‍ර දැක්වීම සඳහා යොදාගත් ඉහත ප්‍රස්තාර වර්ගය හැඳින්වෙන්නේ ........................................ යනුවෙනි.



EXAMMOOD.LK
EXAMMOOD.LK

- අංක **31** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා, ඊට හිමි **අංකය** ඉදිරියේ ඇති **තිත් ඉර මත ලියා දක්වන්න.**

**31.** අභ්‍යාවකාශයේ සිට පෘථිවියට පැමිණෙන උල්කාෂ්ම බොහෝමයක් දැවී, විනාශ වන්නේ
(1) පරිවර්තී ගෝලය තුළ දී ය. (2) අපරිවර්තී ගෝලය තුළ දී ය.
(3) තාප ගෝලය තුළ දී ය. (4) මෙසෝ ගෝලය තුළ දී ය. (.........)

**32.** මහද්වීපික කබොල නිර්මාණය වී ඇත්තේ,
(1) සිලිකේට්වලිනි. (2) බැසෝල්ට් පාෂාණවලිනි.
(3) ග්‍රැනයිට් පාෂාණවලිනි. (4) මැග්නීසියම්වලිනි. (.........)

**33.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් ජෛවගෝලය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) ජෛවගෝලය යනු නිරතුරු ක්‍රියාකාරී සමස්ත ජීවී පරිසරයයි.
(2) ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය සිදුවන්නේ ජෛවගෝලය තුළ ය.
(3) ජෛවගෝලයේ ශාක හා සත්ත්ව ජීවීන් අතර අන්තර් ක්‍රියාකාරීත්වයක් දක්නට ඇත.
(4) ජෛවගෝලය මුළුමනින්ම සමන්විත වන්නේ ශිලාගෝලය හා ජලගෝලයේ කොටස්වලිනි. (.........)

**34.** 'නිවර්තන කලාපය' ලෙස හැඳින්වෙන්නේ,
(1) කර්කටක නිවර්තනයත් සමකයත් අතර කලාපයයි.
(2) කර්කටක නිවර්තනයත් මකර නිවර්තනයත් අතර කලාපයයි.
(3) මකර නිවර්තනයත් ඇන්ටාක්ටික් වෘත්තයත් අතර කලාපයයි.
(4) සමකයත් මකර නිවර්තනයත් අතර කලාපයයි. (.........)

- අංක **35** සහ **36** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගන්න.
  A - ඕසෝන් ස්තරය හායනය වීම
  B - පාංශු ඛාදනය
  C - අහිතකර හිරු කිරණ පෘථිවි පෘෂ්ඨයට පතිත වීම
  D - කෘෂි අස්වැන්න
  E - වායුගෝලීය උෂ්ණත්වය

**35.** එක් සාධකයක වැඩිවීම වෙනත් සාධකයක අඩුවීම කෙරෙහි බලපෑමක් ඇති කරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුළත් පිළිතුර වනුයේ,
(1) A හා C ය. (2) A හා D ය. (3) C හා E ය. (4) B හා D ය. (.........)

**36.** එක් සාධකයක වැඩිවීම තවත් සාධකයක ද වැඩිවීම කෙරෙහි බලපෑමක් ඇති කරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුළත් පිළිතුර වනුයේ,
(1) A හා C ය. (2) C හා E ය. (3) A හා E ය. (4) B හා D ය. (.........)

**37.** මානුෂ සංවර්ධන දර්ශකය (HDI) අනුව ලෝකයේ රටවල් බෙදිය හැකි කාණ්ඩ සංඛ්‍යාව
(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි. (.........)

**38.** මානව ක්‍රියාකාරකම් මත තීව්‍ර වන ස්වාභාවික උපද්‍රවයක් ලෙස හැඳින්විය හැක්කේ පහත සඳහන් ඒවායින් කවරක් ද?
(1) භූමිකම්පා (2) ගිනිකඳු පිපිරීම් (3) සුනාමි (4) නායයෑම් (.........)

**39.** රත්තොට, මීටියාගොඩ, බොරලැස්ගමුව වැනි ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇති ඛනිජය වන්නේ,
(1) මිනිරන් ය. (2) හුණුගල් ය. (3) කෙඔලින් ය. (4) මැණික් ය. (.........)

**40.** ශ්‍රී ලංකාවේ නායයෑම් බහුලව සිදු වන දිස්ත්‍රික්ක යුගලය තෝරන්න.
(1) කෑගල්ල, නුවරඑළිය (2) මාතලේ, කුරුණෑගල
(3) මහනුවර, මොණරාගල (4) බදුල්ල, ගම්පහ (.........)

* *

/පස්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 | S | I, II

63095

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

## භූගෝල විද්‍යාව II

* මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

## I කොටස

**1.** (අ) ඔබ වෙත සපයා ඇති 1:50 000 හු ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු දීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක 8) යොදා ගන්න.

අංක (i) සිට (iv) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) අංක ① න් දක්වා ඇත්තේ කුමක් ද?
(රක්ෂිත වන මායිම / ගල / ගල්වල) (ලකුණු 01 යි)

(ii) අංක ② න් දක්වා ඇත්තේ කුමක් ද?
(වනාන්තරය / ලඳුකැලෑ / හේන) (ලකුණු 01 යි)


(iii) අංක ③ න් දක්වා ඇත්තේ කුමක් ද?
(බෞද්ධ සිද්ධස්ථානය / ඓතිහාසික ස්ථානය / සංචාරක බංගලාව) (ලකුණු 01 යි)

(iv) අංක ④ න් දක්වා ඇති පරිපාලන මායිම කුමක් ද?
(දිස්ත්‍රික් මායිම / පළාත් මායිම / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මායිම) (ලකුණු 01 යි)

(v) **A** අක්ෂරයෙන් දක්වා, කොටුකර ඇති කොටසෙහි සංකේතවලින් දැක්වෙන, ජනතාවට පොදු සේවා සපයන ආයතනයක් නම් කරන්න. (ලකුණු 01 යි)

(vi) සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත (a), (b) හා (c) යටතේ දක්වා ඇත. ඒ එක් එක් ප්‍රකාශය කියවා බලා නිවැරදි නම් '**නි**' යන්න ද, වැරදි නම් '**වැ**' යන්නද පිළිතුරු පත්‍රයේ ඊට නියමිත ස්ථානයෙහි ලියා දක්වන්න.
(a) සිතියම් ප්‍රදේශයේ විවිධ ආගමිකයන් වාසය කරන බවට සාධක ඇත. (ලකුණු 01 යි)
(b) ප්‍රදේශයේ වී වගාව කරනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ම වැසි ජලය උපකාරයෙනි. (ලකුණු 01 යි)
(c) සිතියම් ප්‍රදේශය ශ්‍රී ලංකාවේ පහතරට වියළි කලාපයට අයත් ප්‍රදේශයකි. (ලකුණු 01 යි)

(vii) යාබදව ඇඳ ඇති හරස්කඩය හොඳින් අධ්‍යයනය කොට එය නිර්මාණය කර ඇත්තේ සිතියමෙහි දක්වා ඇති **X - Y** හා **P - Q** යන රේඛා දෙකෙන් කුමන රේඛාවට අනුකූලව දැයි දක්වන්න. (ලකුණු 01යි)




(viii) **B** අක්ෂරයෙන් දක්වා ඇති ස්ථානය ඔස්සේ විහිදෙන දේශාංශය නිවැරදිව සඳහන් කරන්න. (ලකුණු 01යි)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුව (පිටු අංක 9) යොදා ගන්න.

(i) **A, B** හා **C** යන අක්ෂර අතුරෙන් කොරල් පාෂාණවලින් නිර්මිත 'මහා බාධක පරය' දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) **D, E** හා **F** යන අක්ෂරවලින් දක්වා ඇති අර්ධද්වීප තුන අතුරෙන් 'කැම්චැට්කා' අර්ධද්වීපය දැක්වෙන අක්ෂරය කුමක් ද?

[ හයවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

(iii) **G, H** හා **J** යන අක්ෂරවලින් දැක්වෙන රටවල් තුන අතුරෙන් යකඩ හා වානේ නිෂ්පාදනයට වැදගත් 'බ්‍රසීලය' දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) **K, L** හා **M** යන අක්ෂරවලින් දැක්වෙන රටවල් තුන අතුරෙන් අප්‍රිකාවේ ජනාධික ම රට වූ 'නයිජීරියාව' දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) **P, Q** හා **R** යන අක්ෂරවලින් දක්වා ඇති ප්‍රදේශ තුන අතුරෙන් ඉතා අඩු ජන ව්‍යාප්තියක් ඇති ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුව (පිටු අංක 09) යොදා ගන්න.

(i) **A, B** හා **C** යන අක්ෂර අතුරෙන් මෑතක දී නියඟයෙන් බහුලව පීඩාවට පත් 'පොළොන්නරු' දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) **D, E** හා **F** යන අක්ෂර අතුරෙන් ඉල්මනයිට් ඛනිජ නිධියක් පිහිටි 'පුල්මුඩෙයි' දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) **G, H** හා **J** යන අක්ෂර අතුරෙන් සංචාරකයන් අතර ජනප්‍රිය 'නිලාවේලි' වෙරළ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) **K, L** හා **M** යන අක්ෂර අතුරෙන් 'නොරොච්චෝලෙයි තාප බලාගාරය' පිහිටි ස්ථානය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) **P, Q** හා **R** යන අක්ෂර අතුරෙන් 'වැලිගම ධීවර වරාය' දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ලකුණු 05 යි)

## II කොටස


**2.** (i) වායුගෝලයේ සංයුතිය අනුව එහි බහුලව ම අඩංගු වායු වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) වායුගෝලයේ ස්තර අතුරෙන් පරිවර්තී ගෝලය මිනිසාට වඩා වැදගත් වීමට හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) පෘථිවියෙහි ජලය ව්‍යාප්ත වී ඇති ආකාර **තුනක්** සඳහන් කරන්න.

(b) වර්තමානයේ ජලයේ ගුණාත්මකභාවය අඩු වීම කෙරෙහි බලපා ඇති මිනිස් ක්‍රියාකාරකම් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

● අංක **3** සහ **4** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ලෝක සිතියම ආධාර කර ගන්න.




**3.** (i) ඉහත ලෝක සිතියමෙහි,

(a) **A** අක්ෂරයෙන් දැක්වෙන වනාන්තර වර්ගයත්

(b) **B** අක්ෂරයෙන් දැක්වෙන වනාන්තර වර්ගයත්

මොනවා දැයි පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) මිනිස් වර්ගයාට වනාන්තර වැදගත් වීමට හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) වර්තමානයේ වනාන්තර හා වන ජීවීන් මුහුණ පා ඇති ගැටලු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)



EXAMMOOD.LK


4. (i) ඉහත ලෝක සිතියමෙහි **D** හා **E** අක්ෂරවලින් දක්වා ඇති වාණිජ මට්ටමින් වී වගා කරන රටවල් **දෙක** මොනවා දැයි පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (a) ඉතාලියේ වී වගාවට ප්‍රසිද්ධ ගංගා නිම්නය කුමක් දැයි නම් කරන්න.

(b) ලෝකයේ වී වගාව සම්බන්ධයෙන් දක්නට ලැබෙන මෑතකාලීන ප්‍රවණතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ශ්‍රී ලංකාවේ වී වගා කරනු ලබන ප්‍රධාන කලාප ඇතුළත් සිතියමක් යාබද ව දැක්වේ. එහි සඳහන් අංක **1** හා **2** කලාප මොනවා දැයි පිළිවෙළින් නම් කරන්න.

(b) ඔබ නම් කළ කලාප දෙකෙන් **එක්** කලාපයක වී වගාවෙහි කැපී පෙනෙන ලක්ෂණ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)




5. (i) විද්‍යුත් කර්මාන්තයට ප්‍රමුඛත්වය ගන්නා ආසියාතික රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) වෙනත් නිෂ්පාදන කර්මාන්තවලට වඩා විද්‍යුත් නිෂ්පාදන කර්මාන්තයෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ විද්‍යුත් කර්මාන්තය සම්බන්ධයෙන් පහත සඳහන් ශීර්ෂ යටතේ විස්තරයක් කරන්න.
(a) කර්මාන්තය ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ
(b) කර්මාන්තය ආශ්‍රිත ගැටලු **දෙකක්**
(c) කර්මාන්තය ආශ්‍රිත ප්‍රවණතා **දෙකක්**
(ලකුණු 05 යි)

6. (i) ලෝක ජන සංඛ්‍යා ව්‍යාප්තිය කෙරෙහි බලපාන
(a) භෞතික සාධක **එකක්** ද
(b) මානුෂ සාධක **එකක්** ද නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ලෝකයේ ප්‍රධාන ජන සංකේන්ද්‍රණවල දැකිය හැකි විශේෂ ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවල අධික ජන සංඛ්‍යාවක් ඒකරාශී වීම කෙරෙහි බලපා ඇති සාධක **තුනක්** සඳහන් කරන්න.

(b) ඉහත සඳහන් දිස්ත්‍රික්ක දෙක තුළ ජන සංඛ්‍යාව ඒකරාශී වීම නිසා උද්ගත වී ඇති ගැටලු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

7. (i) මානුෂ සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා යොදා ගන්නා නිර්ණායක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගතියට පසුගිය දසවසර තුළ ගෙන ඇති පියවර **තුනක්** විස්තර කරන්න. (ලකුණු 03 යි)

(iii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනයට යොදා ගත හැකි ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

8. (i) ගෝලීය උෂ්ණත්වය ඉහළ නැගීම කෙරෙහි බලපාන
(a) මිනිස් ක්‍රියාකාරකම් **එකක්** හා
(b) ස්වාභාවික හේතු **එකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) දේශගුණික වෙනස්වීම් නිසා මානුෂ කටයුතුවලට ඇති වන අහිතකර බලපෑම් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) දේශගුණික වෙනස්වීම් අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

* * *

EXAMMOOD.LK
EXAMMOOD.LK

63095

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர(சாதாரண தர) ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

විභාග අංකය / சுட்டெண் / Index Number ....................................

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத் துக்கு மட்டும்
For Examiner's Use Only

1. (අ) /(அ) /(a)

(i) ....................................................................................................

(ii) ....................................................................................................

(iii) ....................................................................................................

(iv) ....................................................................................................

(v) ....................................................................................................

(vi) (a) ....................................................................................................

(b) ....................................................................................................

(c) ....................................................................................................

(vii) ....................................................................................................


(viii) ....................................................................................................

10

EXAMMOOD.LK
EXAMMOOD.LK


/නවවැනි පිටුව බලන්න

(ආ) /(ஆ) /(b)




(i)
(ii)
(iii)
(iv)
(v)
/5

(ඉ) /(இ) /(c)




(i)
(ii)
(iii)
(iv)
(v)
/5

1. (අ) (அ) (a) /10 (ආ) (ஆ) (b) /5 (ඉ) (இ) (c) /5 = /20

EXAMMOOD.LK
EXAMMOOD.LK

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)


NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

භූගෝල විද්‍යාව II / புவியியல் II / Geography II




SCALE 1:50000